*සැ. යු.* - 2012.06.22 දින පළ වූ අංක 1,764 දරන *ගැසට් පත්‍රයේ* I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,765 - 2012 ජුනි මස 29 වැනි සිකුරාදා - 2012.06.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 136 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 138 |

*සැ. යු.*- ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජුනි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම් 2012 ජූලි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවින්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.ආ.)*

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එච්. එම්. එම්. යූ. බී. හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2006.05.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/කොත්/2363 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කලපිටිය, අලුත්වත්ත, පදිංචි දඹුල්ලාගේ කුඹුරේ දමයන්ති මැණිකේ වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කොත් 05/806/2006 යටතේ 2006.09.08 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදපනේ පත්තුවේ/කෝරලේ කලපිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අලුත්වත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූද, නුවරඑළිය මැනුම් අධිකාරී භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/24/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/මැනුම් අධිකාරී විසින් සම්පාදිත අංක මු. පි. නු. 1112 දරන පිඹුරේ අංක 59 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.107 ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. න. 1112 හි කැ. අ. 39, 38 සහ වර්ධනාකුඹුරේ වත්ත ; |
| *නැගෙනහිරට* | : | වර්ධනාකුඹුරේ වත්ත සහ මු. පි. නු. 1112 හි කැ. අ. 63 සහ 60 ; |
| *දකුණට* | : | මු. පි. නු. 1112 හි කැ. අ. 60 සහ 26 ; |
| බස්නාහිරට | : | මු. පි. නු. 1112 හි කැ. අ. 26, 57, 58 සහ 39. |

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2011 ජූලි මස 19 වැනි දින.

06-1079/1

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) තිලක් ගාමිණී මුණසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පාහේ/753 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩදෙල්තොට පදිංචි අබ්දුල් හසන් වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්ඩීඕ/ජී/3/9/95 යටතේ 1995.08.08 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්දහය දකුණ කෝරළේ උඩදෙල්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩදෙල්තොට නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද මහනුවර මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍රයෙහි/මැනුම් අධිකාරී විසින් සම්පාදිත අංක මු. පි. මහ 728 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/මහනුවර මැනුම් අධිකාරී විසින් සම්පාදිත අංක මු. පි. මහ 728 දරන රේඛා සටහනේ අංක 10 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 03 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම:

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩී. එම්. වෙත්තසිංහ මහතා සහ තවත් අය හිමිකම් කියන බෙල්වුඩ් වත්ත; |
| *නැගෙනහිරට* | : | එම බෙල්වුඩ් වත්ත සහ තලාතුඔය මාර්ගය; |
| *දකුණට* | : | ගලහ බෙල්වුඩ් මාර්ගයේ මාර්ග රක්ෂිතය හා කට්ටි අංක 09 කොටසක්; |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 9, වෙත්තසිංහ මහතා හා වෙනත් අය භුක්ති විඳින බෙල්වුඩ් වත්ත. |

ටී. ගාමිණී මුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2010 සැප්තැම්බර් මස 01 වැනි දින.

06-1079/2

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජී. ඒ. කිත්සිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/මනුප/

ප්‍ර/516 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තෙප්පන්කුලම හි පදිංචි ගංගොඩගේ ජයවික්‍රම වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 91/54 යටතේ 1996.07.08 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇති නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .................... පත්තුවේ/කෝරළේ අංක 316 තෙප්පන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තෙප්පන්කුලම නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් තුනක විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ගොඩ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | අතුරු පාර; |
| *නැගෙනහිරට* | : | එම්. ජී. අල්විස් පදිංචි ඉඩම; |
| *දකුණට* | : | සුනිල් සූරියආරච්චි පදිංචි ඉඩම; |
| *බටහිරට* | : | ඩී. ඩී. චලෝ සිංඤෝ පදිංචි ඉඩම. |

පී. ඒ. කිත්සිරි,
ප්‍රාදේශීය ලේකම්.

2010 නොවැම්බර් මස 26 වැනි දින,
මධ්‍යම නුවරගම් පළාත,
පණ්ඩුලගම,
අනුරාධපුරය.

06-1079/3

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම -(104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරුමැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/ආර්. එම්. ජී. සේනාරත්න වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1997 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර 4153 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජාංගනය, යාය 11 පදිංචි ඇරුල්ගොඩ මුදියන්සේලාගේ බ්‍රම්පිසිංඤෝ වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 304/16 යටතේ 1998.05.28 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු විලච්චිය කෝරළේ 453 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ යාය 11 නමැති ගමේ පිහිටා ඇත්තාවූද ප්‍රමාණයෙන් අක්කර 02, ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (මඩ)

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 240- කෙත් ඇළ රක්ෂිතය; |
| *නැගෙනහිරට* | : | එම්. එම්. ටිකිරිබණ්ඩාගේ මඩ ඉඩම (අංක 31); |
| *දකුණට* | : | දියබස්නා ඇල රක්ෂිතය; |
| *බස්නාහිරට* | : | උපාලි නිශ්ශංකගේ මඩ ඉඩම (අංක 30 ඒ). |

ආර්. එම්. ජී. සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2011 මාර්තු මස 21 වැනි දින.

06-1079/4

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරුමැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රත්නායක මුදියන්සේලාගේ ගාමිණී සේනාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින්, 1981.06.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර 1812 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, දකුණ ඉවුර, යාය 05 පදිංචි විජේසේකර ගමාච්චිගේ සෝමාවතී වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1617 යටතේ 1982 අගෝස්තු මස 12 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල /කෝරළේ අංගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංගමුව නමැති ගමේ පිහිටා ඇත්තාවූද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 04 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අ.ග.සි. 439 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/සර්වේ ජනරාල් විසින් සම්පාදිත රේඛා සටහනේ අංක 458 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන්

රූඩ් 02 පර්චස් 18 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ගොඩ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | උස්සාන ඉඩම්; |
| *නැගෙනහිරට* | : | උස්සාන ඉඩම්; |
| *දකුණට* | : | කැබලි අංක 470, 471 ගොඩ ඉඩම්; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 459 ගොඩ ඉඩම. |

ආර්. එම්. ජී. සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2011 පෙබරවාරි මස 14 වැනි දින.

06-1079/5

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරුමැද පළාත් සභාවේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ආර්. එම්. ජී. සේනාරත්න වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982 ජුනි 29 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර 2601 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජාංගනය, යාය 09 පදිංචි ඩිංගිරියාගේ බට්ටා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1/2539 යටතේ 1982 අගෝස්තු 23 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2012.07.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු විලච්චිය කෝරළේ 5ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රාජාංගනය, යාය 09 නමැති ගමේ පිහිටා ඇත්තාවූද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 06 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. සි. අ. 25 දරන කට්ටි කැබීමේ පිඹුරේ ................ විසින් සම්පාදිත අංක .............. දරන රේඛා සටහනේ අංක 198 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර 03, පර්චස් 35 ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායම් වූ ද රජයේ ඉඩම: මඩ

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 199 ඇළ රක්ෂිතය; |
| *නැගෙනහිරට* | : | අංක 230 ඇළ රක්ෂිතය; |
| *දකුණට* | : | අංක 336 යෝධ ඇළ රක්ෂිතය; |
| *බස්නාහිරට* | : | අංක 197 කුඹුරු ඉඩම. |

ආර්. එම්. ජී. සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2011 මාර්තු මස 21 වැනි දින.

06-1079/6

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/ත්‍රිකු/පදවි ශ්‍රී පුර- (1).
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ත්‍රි/ඉ/1/7.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත නම් සඳහන් 08 දෙනකු විසින්, ඒ හා දක්වා ඇති විස්තර වලට අදාළ ඉඩම් කැබලි නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* බදු කාලය.- අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2012 ජූනි මස 07 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| | ඉඩම් කොමසාරිස්ගේ ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ගම | පිඹුරු අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 4/10/30235 | එස්. සුනිල් සෙනවිරත්න | පදවි ශ්‍රීපුර | 31, ඩී ශ්‍රී පුර | ශ්‍රී පුර | එෆ්. සී. පී. ත්‍රී 44 | 558න් කොටසක් | හෙක්. 0.0383 | උතුරට : කැබලි අංක 559<br>නැගෙනහිරට : කැබිලි අංක 558න් කොටසක් සහ 557<br>දකුණට : කැබලි අංක 556<br>බටහිරට : කැබලි අංක 550. |
| 2. | 4/10/30226 | ගබ්බල ගෙදර මහින්ද සේනාරත්න | පදවි ශ්‍රීපුර | 31, ඩී ශ්‍රී පුර | ශ්‍රී පුර | එෆ්. සී. පී. ත්‍රී 44 | 538 | හෙක්. 0.0219 | උතුරට : කැබලි අංක 516 සහ 515<br>නැගෙනහිරට : කැබලි අංක 515<br>දකුණට : කැබලි අංක 539<br>බටහිරට : කැබලි අංක 537 සහ 516 |
| 3. | 4/10/30214 | පල්ලියගුරුගේ හීන්බණ්ඩා | පදවි ශ්‍රීපුර | 31, කේ සේවා ජනපදය | පලුගහ වංගුව | එෆ්. සී. පී. ත්‍රී 47 | 215න් කොටසක් | හෙක්. 0.0329 | උතුරට : කැබලි අංක 208, 214 සහ 211<br>නැගෙනහිරට : කැබලි අංක 211<br>දකුණට : කැබලි අංක 216<br>බටහිරට : කැබලි අංක 215න් කොටසක් |

| | ඉඩම් කොමසාරිස්ගේ ගොනු අංකය | අයදුම්කරුගේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ගම | පිඹුරු අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4. | 4/10/30203 | ධර්මසේන ආරච්චිගේ උඩතැන්නේ ගෙදර කපිල කුමාර ධර්මරත්න | පදවි ශ්‍රීපුර | 31, ඩී ශ්‍රී පුර | ශ්‍රී පුර | එෆ්. සී. පී. ත්‍රි 44 | 486න් කොටසක් | හෙක්. 0.0432 | උතුරට : කැබලි අංක 486න් කොටසක්<br>නැගෙනහිරට : 485 සහ 481<br>දකුණට : කැබලි අංක 166<br>බටහිරට : 487 සහ 478 |
| 5. | 4/10/30205 | හේරත් මුදියන්සේලාගේ කෝරලේ ගෙදර කුඩා මැණිකේ | පදවි ශ්‍රීපුර | 31, කේ සේවා ජනපදය | සේවා ජනපදය | එෆ්. සී. පී. ත්‍රි 44 | 428 | හෙක්. 0.0429 | උතුරට : කැබලි අංක 412 සහ 25<br>නැගෙනහිරට : 25 සහ 429<br>දකුණට : 450<br>බටහිරට : 450 සහ 427 |
| 6. | 4/10/30227 | මේ නොව රාලලාගේ සුසන්ත | පදවි ශ්‍රීපුර | 31, කේ සේවා ජනපදය | පලුගහ වංගුව | එෆ්. සී. පී. ත්‍රි 47 | 213න් කොටසක් | හෙක්. 0.0160 | උතුරට : කැබලි අංක 212<br>නැගෙනහිරට : කැ. අ. 211<br>දකුණට : කැ. අ. 214<br>බටහිරට : 213න් කොටසක් |
| 7. | 4/10/30195 | වික්‍රමආරච්චිගේ ෂෙල්ටන් අශෝක වික්‍රමසිංහ | පදවි ශ්‍රීපුර | 31, ඩී පදවි ශ්‍රී පුර | පලුගහ වංගුව | එෆ්. සී. පී. ත්‍රි 44 | 438න් කොටසක් | හෙක්. 0.0380 | උතුරට : කැ. අ. 25<br>නැගෙනහිරට : කැ. අ. 439<br>දකුණට : කැ. අ. 438න් කොටසක්<br>බටහිරට : 437 |
| 8. | 4/10/30202 | විජේසිංහ ඒකනායක ස්වර්ණලතා | පදවි ශ්‍රීපුර | 31, ඩී පදවි ශ්‍රී පුර | පලුගහ වංගුව | එෆ්. සී. පී. ත්‍රි 44 | 456න් කොටසක් | හෙක්. 0.0506 | උතුරට : කැබලි අංක 455<br>නැගෙනහිරට : කැ. අංක 457<br>දකුණට : කැබලි අංක 457 සහ 461<br>බටහිරට : කැබලි අංක 456න් කොටසක් |

06-1005

---

ඉඩම් කොමසාරිස්ගේ ජනරාල්ගේ අංකය : 4/10/22185.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : 5/2/7/පහු/94 දී.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ඇල්ලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇල්ලගම ගමේ කච්චේරි මිනින්දෝරු විසින් 2005.12.06 දිනැතිව අඳින ලද අනුරේඛනයේ කැබලි අංක ඒ වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා එච්. එම්. පුණ්‍යදාස බණ්ඩාර මහතා විසින් බදු ඉල්ලා ඇති බව නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:-

*උතුරට* : කඳුර දිගේ යෝජිත වෙන්කළ බිම ;
*නැගෙනහිරට* : මාර්ගය සඳහා යෝජිත වෙන්කළ බිම ;
*දකුණට* : කැබලි අංක 778 ;
*බටහිරට* : කැබලි අංක 776.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි - වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* බදු කාලය : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2010.02.11 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ./මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමේ හිමිකම 2010.02.11 වැනි දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමි වේ. ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. එම්. පී. වීරසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

2012 ජුනි මස 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-1078

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/33695.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ඉකෝ/09/තිස්/දීබ 97.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක 19, කිරින්ද ග්‍රාම නිලධාරි වසමේ කිරින්ද ගමේ TSS/2007/260 අනුරේඛනයේ කැබලි අංක B වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.607 ක් වාණිජ කටයුතු (සංචාරක බංගලාවක් ඉදිකිරීම) සඳහා චින්තක චන්න අබේවර්ධන මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | පී.ඩබ්. ලයනල් මයාගේ ඉඩම සහ එල්. පියසේන මයාගේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | කිරින්ද සිට යාල දෙසට මාර්ගය සඳහා වෙන් කර ඇති රක්ෂිතය- කැබලි අංක C; |
| *දකුණට* | : | නිවාසවලට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | එම්. කේ. සුනිල්, ජී. ඩී. එස්. එන්. අබේසේකර සහ එස්. එම්. මොහොට්ටි යන අයගේ ඉඩම් |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2012.04.03 සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2012 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ බදු මුදලින් 50%කට නොඅඩු විය යුතුය.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කළින් අතුරු බදු දීම් කළ නොහැක;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. එම්. පී. පී. වීරසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2012 ජුනි මස 08 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.
06-1085

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/32351.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L04/01/04.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 495 ග්‍රාම නිලධාරී වසමේ අක්කර පන්සීය ගමේ පිහිටි අංක 899 පිඹුරේ ප්‍රමාණයෙන් පර්. 25ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වානිජ කටයුතු සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :

| | |
|---|---|
| *උතුරට* | : හිරිපිටියාගම ගල්නෑව පාර; |
| *නැගෙනහිරට* | : ගම මැද පාර; |
| *දකුණට* | : සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල; |
| *බටහිරට* | : ඒ. ආර්. එම්. කමලා කුමාරිහාමිගේ ගොඩ ඉඩම |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) යි (2011.12.12 දින සිට)

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරගේ තක්සේරුව මත, 2011 වර්ෂයේ ඉඩමේ වානිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකල බදු මුදලින් 50%ට නොඅඩු විය යුතුය.

*වාර මුදල* .- වාර්ෂික බදු මුදල තුන් ගුණයකි.

(ඇ) මෙම ඉඩම වානිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්තවයකින් පවත්වා ගෙන යා යුතුය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ;

(ඌ) 2011.12.12 දින සිට අවුරුදු පහක අවම කාලයක් ඉකුත් වීමට පෙර අතුරු බදුදීම් කළ නොහැක;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2012 ජූනි මස 07 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-1006

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/29349.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/එල්/ 06/15/04.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 295, ඒ, දේවානම්පියතිස්සපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මැගසින් පාර, තිසාවැව ගමේ ඉඩම් නිලධාරි විසින් සකස් කරන ලද දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් පර්. 20ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා සරත් වාගොල්ල මහතා විසින් බදු ඉල්ලා ඇති බව නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:-

| | | |
|---|---|---|
| *උතුරට* | : | නාගූර් අඩුවේ පදිංචි ඉඩම ; |
| *නැගෙනහිරට* | : | පී. ආර්. සොදිනා පදිංචි ඉඩම ; |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය ; |
| *බටහිරට* | : | ආර්. උක්කු අම්මා පදිංචි ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ 1995 වර්ෂයේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2010.02.11 වැනි දිනයේ සිට වසර පහක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. 2010.02.11 දිනයේ සිට වසර පහක් ගත වීමෙන් පසු නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමකම ලැබේ ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

*(ඒ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 ජුනි මස 01 වැනි දින,
බත්තරමුල්ල, රජමල් මාවත, මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-886

---

පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : 4/10/ත්‍රිකුණාමලය/කන්තලේ/(11).
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : KNT/LTL/(323) 1.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත නම් සඳහන් දෙදෙනෙකු විසින්, ඒ හා දක්වා ඇති විස්තර වලට අදාළ ඉඩම් කැබලි නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය.-* අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල .-* ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඞ්)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඪ)* අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

*(ඪා)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

*(එ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂාණි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 ජුනි මස 11 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| *අනු. අංකය* | *ඉඩම් කොමසාරිස්ගේ ගොනු අංකය* | *අයදුම්කරුගේ නම* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *ගම* | *පිඹුරු/ අනුරේඛන අංකය* | *කැබලි අංකය* | *ඉඩමේ ප්‍රමාණය* | *ඉඩමේ මායිම්* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 4/10/30158 | පතිරණ මුදියන්සේලාගේ අනුලාවතී | කන්තලේ | භාතියගම | කන්තලේ | Tri/KNT 2004/376 | කැබලි අංක ඒ | හෙක්. 0.0253 | *උතුරට* : කැබලි අංක 136<br>*නැගෙනහිරට* : කැ. අ. 135 *(නුවර පාර)*<br>*දකුණට* : කැ. අ. 474<br>*බටහිරට* : කැබලි අංක බී |
| 2. | 4/10/30240 | අබේවික්‍රම වැපිටියගේ ගුණපාල | කන්තලේ | කන්තලේ නගරය දකුණ 227/කේ | කන්තලේ | Tri/KNT 2005/073 | කැබලි අංක ඒ | හෙක්. 0.0253 | *උතුරට* : කැබලි අංක බී<br>*නැගෙනහිරට* : පාර<br>*දකුණට* : ගැමුණු මාවත<br>*බටහිරට* : කැබලි අංක බී |

06-1160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.